# අශ්‍රැවත් පෘතග්ජනයා

රූපය ආත්මය...
රූපයෙන් නිර්මිවූ ආත්මයක්ය...
ආත්මය තුල රූපය පවති...
රූපය තුල ආත්මය පවති...

## වශයෙන් දකිනවා...

වේදනාව, සංඥාව, සංස්කාර, විඥානය
ගැන ද ඉහත ආකාර හතරින්ම මුලාවට පත්වේ...
(එමෙන්ම සියලු මිත්‍යා අදහස් ද...)

ඔහු ගේ ඒ මුලාවට අනුව දැකීමක් ඇත්ද,

එය **සංස්කාරයක්...**

[ සෝ පන සංඛාරෝ කින්නිදානෝ කිංසමුදයෝ කිඤ්ජාතිකෝ කිම්පභවෝති ]

- කුමක් මුල් කරගත් එකක්ද ..?
- කුමකින් හටගත් එකක්ද ..?
- කුමකින් ඉපදෙන එකක්ද ..?
- කුමකින් ප්‍රභවය වන එකක්ද ..?

[ අවිජ්ජාසම්ඵස්සජේන භික්ඛවේ,
වේදයිතේන ඵුට්ටස්ස අස්සුතවතෝ පුථුජ්ජනස්ස
උප්පන්නා තණ්හා තතෝජෝ සෝ සංඛාරෝ ]

මහණෙනි, **අවිද්‍යා** සහගත **ස්පර්ශයෙන්** හටගන්නා **විඳීමෙන්** පහස ලබන අශ්‍රැවත් පෘතග්ජනයාට **තණ්හාව** ඉපදිලයි තියෙන්නේ. අන්න ඒ **තණ්හාවෙනුයි** ඒ **සංස්කාරය** හටගන්නේ...

නමුත් මහණේනි, **ඔය සංස්කාරයත්**
**අර තණ්හාවත්**
**ඒ විඳීමත්**
**ඒ ස්පර්ශයත්**
**ඒ අවිද්‍යාවත්**

## අනිත්‍යයි
## සංඛතයි
## පටිච්චසමුප්පන්නයි

**ඔය විදියට දැනගන්නකොට**
**ඔය විදියට දැකගන්නකොට**
**මේ ජීවිතයේදීම ආස්‍රවයන් ක්ෂය වෙලා යනවා...**

පාරිලෙය්‍යක සූත්‍රය ඇසුරෙනි...